සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 21 S I |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය I** — කාලය පැය එකයි

උපදෙස් :
(1). සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.
(2). අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(3). ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(4). එම උත්තර පත්‍රයේ දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ** අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

01. ඉහළ කළමනාකාරීත්වය චක්‍රලේඛ හා නීතියට ම අනුව කටයුතු කිරීමට යාම නිසා සේවකයෝ **ඇඟ බේරා ගෙන** කටයුතු කිරීමට පෙළඹුණහ.
1. උපායශීලීව මග හරිමින් 2. ශරීරය ආරක්ෂා කරගෙන
3. සීරුවෙන් සිටිමින් 4. කිසිදු හානියක් නොවන සේ

02. සිය නැගණිය **කටු අත්තක්** වගේ යැයි අක්කා කීවා ය.
1. නිතර කේන්ති යන 2. නිතර විහිළු කරන 3. නිතර දබර කරන 4. නිතර නිදා ගන්නා

03. **උපාසක බළලුන්** සේ සිටින මිනිසුන් හඳුනා ගැනීම දුෂ්කර කාර්යයකි.
1. දුදන වෙස් ගත් සුදනන් 2. අනුනට නිතර හිරිහැර කරන
3. හොඳ මෙන් ම නරක වැඩ කරන 4. සුදන වෙස් ගත් දුදනන්

- අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

04. නූතන සමාජය ගොඩනැගීම සඳහා අතීත ශ්‍රී විභූතිය ____________ කිරීම පමණක් ප්‍රමාණවත් නොවේ.
1.ආවරණය 2. ආවර්ජනය 3. ආවර්තනය 4. ආවස්ථික

05. පොසිල වැඩි වශයෙන් අනාවරණය කොට ගෙන ඇති තබ්බෝව තැන්පතුව අනාගත පාෂාණීභූත _________ සඳහා සංරක්ෂණය කළ යුතු වෙයි.
1. ගවේෂණය 2. සමීක්ෂණ 3. නිරීක්ෂණ 4. පර්යේෂණ

06. සාහිත්‍ය කලා නිර්මාණ _________ ලැබෙන ආස්වාදය හේතුවෙන් මිනිස් සිතෙහි හැඟීම් ප්‍රබෝධවත් වෙයි.
1. පරිශීලනයෙන් 2. පරිරක්ෂණයෙන් 3.පරිභාවිතයෙන් 4. පරිවර්තනයෙන්

07. **අකාරාදී පිළිවෙළ නිවැරදි ව** දැක්වෙන පද පේළිය තෝරන්න.
1. ආලකමන්දාව, නෙත නිලුපුල්, තරු ලකුණ, සල්ගහ යට
2. අත් පසුර, කටුගහ යට, ලියවැල, ලස්සනම අහස
3. ඉරබටු තරුව, ගංගා ගීතය, වංකගිරිය අරණේ, සුදු නෙළුම
4. බියනොවන් අයියණ්ඩි, සන්ධ්‍යා තීර්ථය, මධ්‍යම යාමය, සුබ උදෑසන

08. සෑම පදයක ම **අක්ෂර වින්‍යාසය නිවැරදිව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. ව්‍යක්ත, ශිරෝමණී, ළතෝනි, හෙරලි 2. අධම්‍ය, ජීවාණුහරන, තදාශ්‍රිත, පරාවර්තන
3. මස්තිෂ්ක, මෞර්‍ය, රක්තාණු, රංගපීඨ 4. ප්‍රාවරණ, ද්විභාෂක, තිරස්චීන, කෘමිනාෂක

09. ගැට ඇලපිල්ල, රකාරාංශය, **දීර්ඝ පාපිල්ල, දීර්ඝ ඉස්පිල්ල අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
1. පෘථුල, කොල්ලෑව, සෞගත, නීවරණ 2. බෘහස්පති, ප්‍රබල්‍ය, ශූර, ශිඛී
3. භායෲ, ප්‍රාවීණ්‍යය, සූචක, මිණි මුතු 4. කෘෂ්ණ, කූට, හිතෛෂී, මිතභාණී

10. 'දළඟින්' යන වචනය අයත් වන්නේ,
1. පෙර සර ලොප් සඳට ය 2. සර සඳට ය 3. පරසර ලොප් සඳට ය 4. සර දෙස් සඳට ය.

11. 'පාසලෙන් බිහි විය යුත්තේ නිපුණතා පිරි සුචරිතවත් මිනිසෙකි' මෙහි **පාසලෙන්** යනු,
1. සමාස පදයකි 2. නිපාත පදයකි 3. උපසර්ගයකි 4. අවධි විභක්ති පදයකි

12. **ශිෂ්‍ය** බව යන අරුත දෙන '**ශිෂ්‍යත්ව**' යන පදය,
1. කෘදන්තයකි 2. තද්ධිතයකි 3. සමාසයකි 4. ක්‍රියා විශේෂණයකි

13. සියලු ඥාති මිත්‍රාදීහු මේ කනගාටුදායක නිවේදනය පිළිගනිත්වා යන වාක්‍යයෙහි '**පිළිගනිත්වා**' යනු,
1. පූර්ව ක්‍රියාවකි 2. විධි ක්‍රියාවකි 3. අපර ක්‍රියාවකි 4. ආශිර්වාද ක්‍රියාවකි

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන** උත්තරය තෝරන්න.

14. දේශයක **සභ්‍යත්වය** කෙරෙහි බලපාන සාධක අතුරෙන් එකක් නම් අර්ථ ක්‍රමයයි
1. පිබිදීම 2. අභිමානය 3. දියුණුව 4. හැදුණුකම

15. මහගමසේකර යනු දේශානුරාගයෙන් ඔද වැඩි **ස්වාධීන** කවියෙකි.
1. හඬ නැගූ 2. සහජ 3. නිදහස් 4. සුව සේ පැමිණි

16. කිසියම් කාර්යයක් කිරීමේ දී වඩාත් පහසු මං සෙවීමේ **ධර්මතාව** භාෂා භාවිතයේ දී ද බල පවත්වයි.
1. යමක් ස්වභාවික ව සිදුවන පිළිවෙළ 2. බුද්ධ ධර්මයට අනුකූලව සිදුවන
3. නීතියට අනුව සිදුවන 4. දහම් පණිවිඩයක් ගැබ්වුණු

17. පහත සඳහන් පද අයත් වන **ව්‍යාකරණ ප්‍රවර්ගය** තෝරන්න.
**නැටුම, කැපූ, සූරන**
1. කෘදන්ත නාම 2. තද්ධිත නාම 3. සමාස නාම 4. සර්ව නාම

18. කිසි විටෙකත් **නාම මූලයෙන් හෝ ධාතු මූලයෙන් වෙන් නොවී** එහි ප්‍රකෘතීන්ට මුලින් යෙදී අර්ථයන්ට බලපෑම් කරනුයේ,
1. නිපාතයයි 2. උපසර්ගයයි 3. ප්‍රත්‍යයයි 4. විශේෂණයයි

19. එක් එක් පද පේළිවල දී ඇති යුගලවල **සමානාර්ථවත් පද යුගල පමණක්** ඇතුළත් **පද පේළිය** තෝරන්න.
1. ගාම්භීරත්වය - උඩගු කම, නර මුල් - මුදුන් මුල්, අධිවාසනා - ඉවසීම, අමා - අමෘතය
2. අනාවරණය - සොයා දැන ගැනීම, කලටි - නිසි තරමට නොමේරූ, රුසිරි - ශරීර ස්වභාව, තෙදින් - තේජසින්
3. උවම් - උපදෙස්, අසේව - වෙහෙසව, විලිකුන් - හොඳින් ඉදුණු, ආපත්ති - ආපදාව
4. සින්ධුපමාන - ගීත හා සමාන, අනන්‍යතාව - තමාටම අයිති, කිවිසුරු - කවියට අධිපති, බුජ බල - බාහු බලය

20. **විරුද්ධාර්ථවත් පද යුගලයක් නොවන්නේ** මේවායින් කුමක් ද?
1. සම්මාන - අවමාන 2. විවෘත - සංවෘත 3. බහුල - සුලබ 4. ප්‍රබුද්ධ - මුග්ධ

21. ''ශ්‍රී ලංකා භූමි සීමාව අතික්‍රමණය කළ උන් වහන්සේගේ ධර්ම ශාස්ත්‍රීය සේවාව පෙරදිග හා අපරදිග රටවලට ද පැතිරිණි''. මෙහිදී **අතික්‍රමණය** යන්නට යෙදිය හැකි **වඩාත් ම යෝග්‍ය යෙදුම** වන්නේ,
1. අභිබවා යෑම 2. හඹාගෙන යාම 3. පසුකොට යාම 4. ඉක්මවා යාම

22. 'මම උදෑසන අවදි **වී** පොත් **කියවීම සඳහා** පුස්තකාලයට **ගියෙමි**.' මෙම වාක්‍යයේ ක්‍රියා පද වර්ග පිළිවෙළින් දැක්වෙන උත්තරය තෝරන්න.
1. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා 2. අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
3. පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, අවසාන ක්‍රියා 4. පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා

23. වැරදි අදහස දෙන වාක්‍ය තෝරන්න.
1. අකර්මක වාක්‍ය කර්ම කාරක ස්වරූපයෙන් ලිවිය නොහැකි ය.
2. 'සා' යනු ප්‍රමාණාර්ථය හඟවන නිපාතයකි.
3. ගරු කටයුතු යන අර්ථය උදෙසා ආණ, අණු, අණි ප්‍රත්‍ය යෙදේ.
4. ආදර්ශමත් හා ආදර්ශවත් යන යෙදුම් දෙක ම නිවැරදි ය.

24. **ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට** උදාහරණයක් නොවන්නේ කුමක් ද?
1. ළිං පඩිය 2. මංමුලා 3. වල්ලම්බලම 4. මිහිංතලය

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි **උපදේශ ග්‍රන්ථ නාමය** කුමක් ද?
1. දසිත්ල්මරිම 2.යකෝකායරපලෝල 3. යහායකතෂිසු 4. වගලෝරඩවැරාස

- **අංක 26, 27 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26. ගැඹුරට කල්පනා කරන තැනැත්තාට සුළු දෙයක් කිරීම අපහසු වීම
    1. කළුවා මාරපන් ගියා වගෙයි
    2. පණ්ඩිතයාට ඒ දණ්ඩේ යන්න බැරිවා වගෙයි
    3. අන්ධයා ඇතාගේ හැටි කිවුවා වගෙයි
    4. කටුස්සාගේ කරේ රත්තරං බැන්දා වගෙයි

27. තමන් ප්‍රයෝජන ගන්නේත් නැත. අනුන්ට ප්‍රයෝජන ගැනීමට ඉඩ දෙන්නේත් නැත.
    1. කලකදී වහ කලකදී රහ වෙනවාලු
    2. පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගෙයි
    3. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගෙයි
    4. ඉත්තෑවගේ ගෙට කබල්ලෑවා රිංගුවා වගෙයි

28. A - මහාසාර - එදිරිවීර සරච්චන්ද්‍ර    B - රිටුන් - වඳුරන්
    C - බෝඩිම - මහගමසේකර    D - නටා - ගයා - අසමාන පූර්ව ක්‍රියා යුගල පද
    A,B,C,D ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,
    1. A,B හා C පමණි
    2. B,C හා D පමණි
    3. A,C හා D පමණි
    4. සියලුම ඒවා නිවැරදිය

- **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

29. 1. සේවක සේවිකාවන් නියමිත වේලාවට ම කාර්යාලයට යයි
    2. නායකතුමාණෝ සාරවත් කතාවක් පැවැත්වූහ
    3. සිසුන් සියලු දෙනා ශාස්ත්‍රය මැනවින් හදාළේ ය
    4. අපට පැරණි මිතුරෙක් හමුවුණෙමි

30. 1. දුක සැප හමුවේ නුවණැතියෝ නොසැලෙති
    2. වෛද්‍යවරයා රෝගියාගෙන් ගුණා ගුණ විමසූහ.
    3. හෙළ කලාකරුවෝ ශෛලමය ප්‍රතිමා නෙළීමට ශූරයන් වූහ.
    4. පෙදරේරුවකු විසින් ගෙයක් තැනූනහ.

31. සත්‍ය හෙළි **කළහොත්** ඔහු සමාව දෙනු ඇත.
    මම එතරම් උසස් **මිනිසෙකු** නොදුටුවෙමි.
    හිස **වන වනා** කතා කිරීම ඔහුගේ පුරුද්දකි.
    **උගනිව්**, නැත පිට වෙයව්

    A - කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
    B - මිශ්‍ර ක්‍රියා
    C - අනුක්ත කර්මය
    D - විධි ක්‍රියා

    ඉහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදෙන ව්‍යාකරණමය අනුඅංගයන්හි අනුපිළිවෙළ කුමක් ද?
    1. ABCD
    2. BCAD
    3. ACBD
    4. ADBC

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
    ''වැස්ස වහින අවස්ථාවල අතු මෙන් විහිදෙන විදුලි පුපුරු දැක ගන්නට පුළුවන්.''

    1. වැස්ස වහින අවස්ථාවල අතු මෙන් විහිදෙන විදුලි පුපුරු දැක ගත හැකි වෙති
    2. වැසි වසින අවස්ථාවල දී අතු වගේ විහිදෙන විදුලි පුපුරුහු දැක ගත හැකි වේ
    3. වැස්ස වහින අවස්ථාවල දී අතු වගේ විහිදෙන විදුලි පුපුරු දැක ගත හැකි වෙති
    4. වැසි වසින අවස්ථාවල දී අතු වගේ විහිදෙන විදුලි පුපුරු දැක ගත හැකි වේ

33. සිංහලයෙන් ලියවුණු මුල් ම නව ප්‍රබන්ධ කතාව සේ සැලකෙන්නේ,
    1. වාසනාවන්ත හා කාලකන්ණි පවුල
    2. මීනා
    3. මිරිඟුව
    4. රොසලින් හා ජයතිස්ස

34. රූපකයක් රහිත පාඨය තෝරන්න.
    1. දහදිය මුතු ඇට මල් වරුසා වී කරල් බරින් පීදී වැගිරෙයි
    2. වැඳ රඳ පද කමල
    3. එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගිය
    4. ඇත කෝපයෙන් රත් වැ ගිය යවට වැනි ඇස් ඇති ඇත් රජ යැ

35. නාලාගිරි දමනය වර්ණනා කළ පුරාතන සම්භාව්‍ය කෘතියක් නොවන්නේ,
    1. අමාවතුරයි
    2. සද්ධර්මරත්නාවලියයි
    3. පූජාවලියයි
    4. බුත්සරණයි

36. පහත සඳහන් කවියේ හතර වන පදය තෝරන්න.

වඳිමින් සවස නල හැසිරෙන දිගතු වල
සොබමන් සුනිල් මිණි නිල් නුබ තුර විපුල
පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
...........................................................................

1. ලකල ගුවන් තල සිරි යහන නිකසල
2. විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල
3. අතුළ කුසුම් විලසින් සැදෙන තුරු වැළ
4. උදුල සොමි කැලුම් නිසයුරු හිමි පුවළ

- පහත සඳහන් පද්‍ය ඛණ්ඩය ලියා වී ඇති **කාව්‍ය ආකෘතිය** වන්නේ,

37. දුද නොද බිද
බඳ තෙඳ කඳ
කඳ දෙවි රද සාමීනේ
මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබගේ පාලු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නොදී මකා

1. සිවුපද කාව්‍ය 2. නිසඳැස් කාව්‍ය 3. සැහැලි කාව්‍ය 4. ගී කාව්‍ය

38. හේන් භාෂාවේ **අඳුර වැටෙන වේලාව** හඳුන්වන්නේ,
1. අලියන් වේලාව 2. හිනිමිදිරිය 3. වයිතාලය 4. කළුකපා එළිය

39. සපෙක් එකකු කැව නසිනේ ඔහු ම වද
අනෙක් ලොවින් නොනැසෙයි සතෙකුත් එකද
පසක් දුදන පබු කන මුව ළං කළ ද
වගක් නැසෙයි වැනසෙයි එමතු ද ඔහු ද

**යන කවියෙන් කියවෙන්නේ,**
1. වෛර බැඳීමෙන් සිදු වන විනාශය ගැන ය
2. කේලාම් කීමෙන් සිදු වන විනාශය ගැන ය
3. අහංකාර නොවී ජීවත් වීමේ වටිනාකම ගැන ය
4. නොගැළපෙන දේ නොකිරීමේ වටිනාකම ගැන ය

40. පහත සඳහන් පාඨයේ **අර්ථයට වඩාත් සමීප අදහස** දෙන උත්තරය තෝරන්න.

''දහඅට වන සියවස තෙක් ම විලියම් ශේක්ෂ්පියර් සලකන ලද්දේ අප්‍රමාණ ප්‍රතිභාවෙන් යුක්ත වුව ද නිසි ලෙස අධ්‍යාපනය නො ලද ගොරහැඩි නිර්මාණකරුවකු හැටියට ය.''

1. දහඅට වන සියවස දක්වා ම විලියම් ශේක්ෂ්පියර් සලකන ලද්දේ අප්‍රමාණ නිර්මාණ හැකියාවෙන් යුක්ත වුව ද පරිපූර්ණ අධ්‍යාපනයක් නොලැබූ නිර්මාණකරුවකු වශයෙනි.
2. දහඅට වන සියවස තෙක් ම විලියම් ශේක්ෂ්පියර් සලකන ලද්දේ ප්‍රමාණ කළ නොහැකි තරමේ වහා වැටහෙන නුවණ ඇත්තකු වුව ද නිසි පරිදි අධ්‍යාපනයක් නොලැබූ රළු නිර්මාණ කළ තැනැත්තෙකු ලෙසිනි.
3. විලියම් ශේක්ෂ්පියර් විශිෂ්ට නිර්මාණ කුසලතාවක් දැක්වුව ද දහඅට වන සියවස දක්වා ම සලකන ලද්දේ විධිමත් අධ්‍යාපනයක් නොලැබූ දළදඬු නිර්මාණකරුවකු ලෙසිනි.
4. දහඅට වන සියවස තෙක් ම විලියම් ශේක්ෂ්පියර් පිළිගනු ලැබුවේ අපමණ දක්ෂතාවෙන් යුක්ත වුව ද නියම අධ්‍යාපනයක් නොලැබූ කරුණු නිසි ලෙස අවබෝධ කර නොගත් නිර්මාණකරුවකු වශයෙනි.

* * * * *

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 21 S II |

**සිංහල භාෂාව හා සාහිත්‍යය II** — **කාලය පැය දෙකයි**

**උපදෙස් :**
**(1). සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

01. අංක (i) සිට (x) තෙක් සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්** එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පහත සඳහන් අක්ෂර **උත්පත්තිස්ථාන** අනුව **අයත් වන්නේ** කිනම් වර්ගයට දැයි නම් කරන්න.
උ, ඌ, ප්, ඵ්, බ්, භ්, ම්, ඹ

(ආ) සිංහල වර්ණ මාලාවේ **පූර්ණ නාසික්‍ය අක්ෂරය** කුමක්දැයි නම් කරන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ **වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය.** එම වචන දෙක පමණක් නිදොස් කොට ලියන්න.

අභ්‍යාවකාශයේ සිට බලන විට සෞරග්‍රහ මණ්ඩලයේ ඉතාමත් අලංකාර ග්‍රහලෝකය වශයෙන් පෙනෙන්නේ නිල් ග්‍රහලෝකය වන පෘතුවියයි.

(අ) ................................ (ආ) ................................

(iii) පහත සඳහන් පද **විසන්ධි කර කවර සන්ධියකට අයත්** දැයි නම් කරන්න.
(අ) රුවනාර (ආ) නළගන

(iv) පහත සඳහන් වාක්‍ය **සදොස් නම් පමණක් නිදොස්** කොට ලියන්න.
(අ) ධාවන ශුරයෝ දැකීමට බොහෝ දෙනා මග දෙපස රැඳී සිටියහ.
(ආ) මහ පැරකුම් රජතුමා විසින් කරවන ලද බෞද්ධාගමික ගොඩනැගිලි රැසක් පිළිබඳ වංශ කතාවල සඳහන් වූහ.

(v) පහත සඳහන් **වාක්‍ය කර්මකාරයට** හරවන්න.
(අ) නායක හිමිපාණෝ අනුශාසනාවක් කළහ. (ආ) නුඹලා අප පිළිගන්නෙහු

(vi) පහත සඳහන් වාක්‍යාංශ සඳහා දිය හැකි **තනි** පද ලියන්න.
(අ) යමෙකු අල්ලා ගැනීම සඳහා පසු පසින් වේගයෙන් දිව යාම (ආ) අර්ථයට අනුකූල වූ

(vii) පහත සඳහන් පදවලට දිය හැකි **සුදුසු ම විරුද්ධ පදය** ලියන්න.
(අ) දුක්ඛදායක (ආ) ප්‍රතික්ෂේප

(viii) පහත සඳහන් වාක්‍යයේ පද පිළිවෙළ අවුල් සහගත ය. **එය අර්ථයට අනුකූල වන සේ** නිවැරදි ව ගලපා ලියන්න.
අප සමාජ උරුමයන්, ගුණදහම්, අභියෝගයට වැනසී යාමේ සාම්ප්‍රදායික සාරධර්ම හා පා මුහුණ ඇත.

(ix) පහත සඳහන් **ප්‍රත්‍යයාර්ථ නාම පදයන්හී ප්‍රකෘති ප්‍රත්‍ය වෙන් කොට** දක්වන්න.
(අ) ශ්‍රේෂ්ඨ (ආ) රැගුම්

(x) පහත සඳහන් ප්‍රාදේශීය ව්‍යවහාරයන්හී **පොදු වහර** ලියා දක්වන්න.
(අ) කායම (ආ) පැල් ගැහීම

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන **වචන 250 කට නො අඩු වන සේ** රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේදී අනුගමනය කර ඇති ක්‍රියා පිළිවෙළ
- යොදා ගත හැකි මාතෘකාව ආදිය පිළිබඳ මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න.

(අ) ශ්‍රී ලංකාව විවිධ ජාතීන් ජීවත් වන විවිධ ආගම් අදහන හා භාෂා කථා කරන ජන වර්ගවලින් සමන්විත රටකි. එවැනි රටකට හිමි අමිහිරි අත්දැකීම් ඇත මෙන් ම මෑත ඉතිහාසයේ සටහන්ව ඇත. අනාගතයේ දී එවැනි ගැටුම් ඇති නොවීම සඳහා ජාතීන් අතර සන්හිඳියාව ගොඩනැගීම කෙරෙහි දැඩි අවධානයක් යොමුව පවතී. ඒ සඳහා ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරමින් වාක්‍ය රචනයක් ලියන්න.

(ආ) ගෝලීය පරිසර සමතුලිතතාව බිඳ වැටීම නිසා ලෝක ප්‍රජාවට විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු වී තිබේ. ඊට හේතුව අපරීක්ෂාකාරී මානව ක්‍රියාකාරකම් බව නොරහසකි. එබැවින් තිරසර සංවර්ධන උපාය මාර්ග කෙරෙහි ලෝක නායකයන්ගේ අවධානය දැඩිව යොමු වී තිබේ. ශ්‍රී ලංකාව ද ඉන් එකකි.පාසල් තිරසර වැඩ සටහන ඊට දායක වන්නකි. ඊට සක්‍රීයව සහභාගී වීම අප සියලු දෙනාගේ යුතුකමකි.

(ඉ) මිනිසා කුරිරු බවට පත්කරන භාවාවේග සමනය කොට ප්‍රසන්න මනුෂ්‍යත්වය දායාද කළ හැකි මහඟු බලය ඇත්තේ කලාවට ය. එහෙත් වර්තමානයේ කලා භාවිතය ලෙස අප දකින්නේ ආහාර ගනිමින් ටෙලි නාට්‍ය බැලීමේ ප්‍රවණතාවන් ය. පොත පත කියවීම, වේදිකා නාට්‍ය,චිත්‍රපට, චිත්‍ර ප්‍රදර්ශන නැරඹීම වැනි ක්ෂේත්‍ර කරා ඇදී යන්නේ අතලොස්සකි. භේදයකින් තොරව විශාල පිරිසක් ජංගම දුරකථනයේ ඕපදූප සමඟ කාලය ගත කරන අයුරු දක්නට ලැබේ. මේ ව්‍යසනයෙන් ජනතාව මුදවා ගත යුතු ය.

(ඊ) ශ්‍රී ලංකාව 'බත' ප්‍රධාන ආහාරය කරගත් ජනතාවක් වෙසෙන කෘෂිකාර්මික රටකි. එහෙත් පසු ගිය දශක කීපයක සිට බොහෝ ප්‍රදේශවල විශාල වගා බිම් ප්‍රමාණයක් පුරන් වී ගොස් ඇති අයුරු දක්නට ලැබීම අවාසනාවකි.තරුණ පිරිස ගොවිතැනින් ඉවත් වීම, ගොවියා වෙනත් ලාභදායී ආර්ථික කටයුතු සඳහා යොමු වීම වැනි කරුණු ඊට බලපා ඇත. අනාගතයේ ආහාර අර්බුදයක් ඇතිවීම වළක්වා ගැනීම සඳහා රටේ සියලු පුරං කුඹුරු යළි අස්වැද්දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් අවශ්‍ය ය.

(ලකුණු 25 යි)

03. පහත දැක්වෙන පාඨ වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශයේ අග ලියන්න.

ගුවන් ගමනාගමනය අද සෑම සමාජයීය, ආර්ථික කටයුත්තක දී ම මුල් තැනක් ගෙන ඇත.එළවළු හා මල් වැනි ඉක්මනින් නරක් වන කෘෂි නිෂ්පාදනවලට නව වෙළඳපලක් විවෘත කළේ ගුවන් පරිවහනය යි. පරිසරය සුරැකීම වන ජීවීන් බෝවීම ගණන් ගැනීම, ලැව් ගිනි මර්දනය, සිතියම්කරණය හා ගොඩබිම් හා සමුද්‍ර දූෂණය පිළිබඳ සෝදිසියෙන් සිටීම ආදී පරිසර සුරැකීමේ කාර්යන්හීලා ගුවන් යානා මහත් සේවයක් ඉටු කරයි. බොහෝ රටවල කෘෂි කර්මාන්තයේ දී බීජ ඉසීම, පළිබෝධ නාශක ඉසීම සඳහා ද හෙලිකොප්ටර භාවිත කෙරේ.

සෞඛ්‍ය ක්ෂේත්‍රය සැලකීමේදී හදිසි අනතුරුවලට පත්වූවන් ප්‍රවාහනයේදීත් තෙල් නිෂ්පාදන කර්මාන්තයේදීත් හෙලිකොප්ටර යානා හා කුඩා ගුවන් යානා යොදා ගැනේ. මිනිසුන්ට හෝ දොඹකරවලට ලඟා වීමට නොහැකි ස්ථානවලට මහා පරිමාණ ගොඩනැගිලි කර්මාන්තයේ දී එසවීම් හා සවිකිරීම් සඳහා විශාල හෙලිකොප්ටර යානා භාවිත වේ. ජාතික රූපවාහිනි ඇන්ටනාව පිදුරුතලාගල සවිකිරීම මීට උදාහරණයකි. සියල්ලන්ට ම වඩා ලෝක ආර්ථිකයට ගුවන් ක්ෂේත්‍රයෙන් ලැබෙන උපරිම දායකත්වය ලැබෙන්නේ දේශීය හා ජාත්‍යන්තර ගුවන් පරිවහන සේවාවන් මගිනි. ගොඩබිම් ප්‍රවාහනය සීමිත හෝ දුෂ්කර වූ ප්‍රදේශවලට ලියුම්, භාණ්ඩ හා මහජනයා ප්‍රවාහනය කිරීමටත්, සංචාරක කර්මාන්තයේදීත් ගුවන් ගමන් ප්‍රධාන තැනක් ගනී.

(ලකුණු 25 යි)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

ශ්‍රී ලංකාවට මෝසම උදාවීමෙන් අනතුරුව මෝසම් පෙරමුණ තවදුරටත් උතුරට ගමන් කරන හෙයින් දිවයින අවට මෝසම් සුළංවල පවතින අභිසරණ තත්ත්වය ක්‍රමයෙන් අඩු වේ. එබැවින් වර්ෂාවේ අඛණ්ඩත්වය ද අඩුවී යයි. එහෙත් වායු ප්‍රවාහයේ දැඩි තෙතමනයන් පවතින හෙයින් ගොඩබිම් හා කඳු හමුවේ එම වාතය එසවීමේදී ශීතල වී ජල වාෂ්ප ඝනීභවනයෙන් විටින් විට වැසි ගෙන දේ. ඝනීභවන ක්‍රියාවලිය උපරිම විය හැකි බටහිර කඳු මුහුණත් ආශ්‍රිතව වැඩි වර්ෂාපතන හට ගනී. විශේෂයෙන් ජූනි මස මුල් දෙසතිය තුළ දී ද වැඩි ජවයකින් මෝසම් සුළඟ පැවතීම නිසා කඳු මුහුණත්වල පවතින වර්ෂාව අඛණ්ඩ ස්වභාවයක් ගෙන සමහර වර්ෂයන්හී රත්නපුර,කෑගල්ල හා නුවරඑළිය වැනි දිස්ත්‍රික්ක තුළ නාය යෑම් පවා සිදු වී ඇත.

සමස්තයක් ලෙස වැසි හා සුළංවල බලපෑම දිගින් දිගට ම අඩුවන අතර අගෝස්තු හා සැප්තැම්බර් මාසවල සාමාන්‍ය මෝසම් වැසි ලැබෙන්නේ ඉතාමත් අඩුවෙනි. යට කී ඝනීභවන ක්‍රියාවලියේ දී නිකුත් කෙරෙන තාප ශක්තිය වායු ප්‍රවාහයට එකතු වීම නිසා කඳු පසු කොට නැගෙනහිරට ගමන් කරන්නේ රත් වූ වාතයයි. එබැවින් දිවයිනේ නැගෙනහිර ප්‍රදේශවල උෂ්ණත්වය බටහිර ප්‍රදේශයන්ට සාපේක්ෂව අංශක කීපයක් ම වැඩි වේ.

1. මෝසම එළැඹීමේ දී ලැබෙන තද වැස්සෙහි අඛණ්ඩත්වය අනතුරුව අඩු වී යාමට හේතුව කුමක් ද?
2. මෝසම පැවැත්වෙන කාල සීමාව තුළ විටින් විට තරමක තද වැසි ලැබීමට හේතුව කුමක් ද?
3. මෝසම් කාලය තුළ දිවයිනේ බටහිර ප්‍රදේශවලට සාපේක්ෂව නැගෙනහිර ප්‍රදේශවල උෂ්ණත්වය ඉහළ අගයක් ගන්නේ ඇයි?
4. මෝසම් සුළං වැඩි වේගයකින් හා අඩු වේගයකින් ක්‍රියාත්මක වන්නේ වර්ෂයේ කිනම් මාසවලදී ද?
5. සෑම වර්ෂයක ම මෝසම් බල පැවැත්වෙන කාලසීමාව තුළ මෙරට නාය යෑම් සිදු වන බව ලේඛකයා පවසා තිබේ ද?

(ලකුණු 2X5=10 යි)

03. ලක්දිව ඉතා පැරණි ගැමි නාටක වත්මන් පරම්පරාවට නැරඹීමට හා රසවිඳීමට අවස්ථා ලබා දීමේ මහඟු මෙහෙවරක් පුබුදුගම 'රණහංස' කලායතනය විසින් ආරම්භ කොට ඇත. එහි ප්‍රථම පියවර ලෙස අතීතයේ උඩරට, වන්නිය හා සතර කෝරළේ ජනප්‍රියව පැවති සොකරි නාට්‍ය රඟ දැක්වීමට නියමිත ය. එහි ප්‍රධාන ආරාධිතයා ලෙස ඉන්දියානු උප කොමසාරිස් සිදු සිං මහතා ඇතුළු විශාල පිරිසක් සහභාගී වේ. දිනය හා වේලාව 2018.12.25 වන දින ප.ව. 6.00 සිට පසුදා පහන් වන තුරු. ස්ථානය, පුබුදුගම නාරංහීන්න වෙල් යායේ පිහිටි 'කමත' රංග භූමියේදී ය. මේ අවස්ථාව දැක බලා ගැනීමට පැමිණෙන ලෙස ප්‍රදේශවාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.ඔබ සංගමයේ ලේකම් ප්‍රමුදිත ආදිත්‍ය යැයි සිතන්න.

නැතහොත්

රට තුළ නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කිරීම හා විදේශ විනිමය උපයා ගැනීම සඳහා ආයෝජකයින් දිරිගැන්වීම පිණිස රජය විසින් විවිධ වැඩසටහන් හා ණය යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත. පී. ආර්. හඳුන්නෙත්ති වන ඔබේ පියා විවිධ ගැටලු මධ්‍යයේ පාරම්පරිකව උරුම වූ හස්ත කර්මාන්තයක නියැළී සිටින අයෙකි. එම ව්‍යාපාරය නවීන වෙළඳපළට ගැළපෙන අයුරින් වැඩි දියුණු කර ගැනීම ඔහුගේ අපේක්ෂාවයි. ඊට අවශ්‍ය උපදෙස් හා ආධාර ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ලිපිය සකස් කිරීමට ඔහුට අවබෝධයක් නැතැයි සිතා පියා විසින් යැවිය යුතු ලිපිය සකස් කර දෙන්න. (ලකුණු 15 යි)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

| 11 ශ්‍රේණිය | අ.පො.ස (සාමාන්‍ය පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2018 | 21 S III |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය III** — කාලය පැය දෙකයි

උපදෙස් :
(1). උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(2). 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.
මෙම පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්** එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) 'හැර ගනුව, මෙබඳු මිණි රුවනක් මේ මුත් නැතැ'

(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් මුල් කෘතිය සිංහලයට පරිවර්තනය කිරීම සඳහා අනුග්‍රහය දැක්වූයේ කිනම් ඇමැතිවරයා ද?

(ii) ''දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන්''

(අ) ඉහත පද්‍ය මුලින් ම ඇතුළත් වූයේ මහගමසේකරයන් විසින් රචිත කිනම් කාව්‍ය සංග්‍රහයේ ද?
(ආ) එහි සඳහන් පරිදි කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද?

(iii) ගුත්තිල ඇඳුරු සඳ
...........................................................
...........................................................
සුදුසු අස්නෙක ගොසින් උන් ෂඳ

(අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි 'සඳ', 'සඳ' යන දෙපදවල අර්ථ වෙන් වෙන් ව ලියන්න.

(iv) 'ජාතික රණ දෙරණ මතේ
ගැටී වැටී මළ මෙහොතේ
සුන්දර සුරඹුන්ගේ අතේ
නැලවෙනු බව සිතනු පුතේ

(අ) මෙම කවියෙන් ලබා දෙන පණිවිඩය කුමක් ද? (එක් වාක්‍යයකින් ලියන්න)
(ආ) එස්. මහින්ද හිමියන් විසින් රචිත වෙනත් දේශාභිමානී පද්‍ය සංග්‍රහයක් නම් කරන්න.

(v) ''අපි ආපු පාර දිගේ පයින්ම මං යන්නම්''

(අ) මේ ප්‍රකාශය කළ තැනැත්තා එසේ ආපසු ගියේ ඇයි?
(ආ) එය ශ්‍රවණය කළේ කවුරුන් විසින් ද?

(vi) (අ) අමාවතුර රචනා කළේ කිනම් බුදු ගුණයක් මුල් කරගෙන ද?
(ආ) සද්ධර්මරත්නාවලිය රචනා කිරීම සඳහා ගුරු කොට ගත් ප්‍රධාන මූලාශ්‍රය කුමක් ද?

(vii) එක් වුණ දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළඳේ කරිවිල තිබ්බටු සේමා

(අ) ඉහත ජන කවිය අයත් වන්නේ කිනම් ජන කවි වර්ගයට ද?
(ආ) කල්යත් ම අගය අඩුවන බව කවියා පවසා ඇත්තේ කෙසේ ද?

(viii) ''වහන්සේ, දුගීමි. බොහෝ දරු බිළිඳුන් ඇත්තෙමි. මට දිවි දෙවයි මරණ බියෙන් වලප්නා පරිදි දු, අත් පා සපන පරිදි දු ආපාතයට එයි.''

(අ) මෙහි වහන්සේ යන්න යෙදී ඇත්තේ කවරකු උදෙසා ද?
(ආ) මෙවැනි සිතුවිලි පහළ වූයේ කිනම් අවස්ථාවක දී ද?

(ix) (අ) සිංහල සංදේශ කාව්‍යවල දූතාශිර්වාදය රචනා කර ඇත්තේ කිනම් විරිතෙන් ද?
(ආ) සැළලිහිණි සංදේශයේ පද්‍ය රචනා කොට ඇති ප්‍රකට විරිත කුමක් ද?

(x) (අ) කාව්‍ය ශාස්ත්‍රයට අදාළ ව ලියවුණු සම්භාව්‍ය කෘතිය නම් කරන්න.
(ආ) ඡන්දස් ශාස්ත්‍රයට අදාළ ව ලියවුණු සම්භාව්‍ය කෘතිය නම් කරන්න. (ලකුණු 2x10=20)

02. පහත දැක්වෙන **ගද්‍ය** හා **පද්‍ය** පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

1. ''දීප්තිමත් නා නා විධ අවි ගනිමින් අනේක ප්‍රකාර විකාර වේශයෙන් ආ දස බිම්බරක් මාර සේනාව සේ භයංකර වූ සේනාවෙහි බාහුවෙන් බාහුව ගසා සිටු වන ලද්දා වූ යෝධ වළල්ලෙකින් ඒ සත් යොදුන් මියුලු නුවර වටලවා ඒ ඒ ස්ථානයෙහි බළ ඇණි සිටු වූහ.''

(අ) මේ පාඨය කුමන අවස්ථාවක් හා සම්බන්ධ වේ ද?
(ආ) 'දස බිම්බරක්' යනු කොපමණ ප්‍රමාණයක් දැයි කෙටියෙන් පහදන්න.

2. ''අසිරිමත් වූ දෙයකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනු පොරණ කිවිඳුන් සොඳ
රස මුසු බසිනා
සියලු භෝග වස්තු
හරිති නෙක් දනෝ
සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය හන්දා''

(අ) මෙහි සඳහන් පරිදි ප්‍රේමයේ නාමයෙන් බොහෝ අය කළ කැප කිරීම කුමක් ද?
(ආ) මෙහි ප්‍රේමය සමාන කොට ඇත්තේ කුමකට ද? එය ඇත්තේ කොහිද?

3. ''මහණෙනි, ම පුතුන් වැන්නවුන්ට භයෙක් කොයින් ද?''

(අ) මෙහි 'ම පුතුන්' යනුවෙන් සඳහන් කළේ කවුරුන් ගැන ද?
(ආ) මේ හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න.

4. වලඳින අදහසින් මෙන් සුර ගඟ අඟන
නල බල සසල දළ රළ පෙළ නුඹ නැගෙන
වෙලලස ගැවසි මුතු සක් පබලු බබළන
බල මහ මුහුද එම සඳ උතුරින් පෙනෙන

(අ) මෙහි සඳහන් ගඟ නමැති ස්ත්‍රිය වැළඳ ගන්නා අදහසින් නැගී සිටියේ කවරෙක් ද?
(ආ) මෙහි දෙවන පේළියේ කැපී පෙනෙන ශබ්දාලංකාරය කුමක් ද?

5. ''ඇහැටවත් නොපෙනෙන සතුන්ට පුළුවන් ද මෙච්චර ලොකු මිනිස් ඇඟකට හානි කරන්න. එහෙනම් මැක්කෝ, මකුණෝ කන තරමට මිනිස්සුයි කියල ජාතියක් ඉතුරු වේවි යැ''

(අ) මෙසේ කීවේ කවුරුන් විසින් ද?
(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 4X5=20 යි)

03. (i) මහෞෂධ චරිතය ප්‍රඥා සම්පන්න මානව හිතවාදී වීමත්,
(ii) කේවට්ට චරිතය ප්‍රඥා සම්පන්න අවස්ථාවාදී වීමත් නිසා හටගත් ගැටලුව හේතු කොට ගෙන උම්මග්ග ජාතකය රසවත් කතා වස්තුවක් වී ඇති අයුරු නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට **උදාහරණ දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

(i) නූතනත්වය ඔස්සේ ගමන් කරන තරුණ පරම්පරාව
(ii) පිය පුතු ගැටුමට මැදි වන මවකගේ ස්වභාවය සිංහබාහු නාට්‍යයේ සිංහබාහු හා සුප්පා දේවි චරිත තුළින් මනාව නිරූපණය වී ඇති අයුරු නියමිත කොටසින් **එක් කොටසකට උදාහරණ දෙක** බැගින් දක්වමින් විමසීමට ලක් කරන්න. (ලකුණු 15 යි)

04. කැරගල පද්මාවතී පිරිවෙන් විහාර පරිශ්‍රයෙහි
   (i) භෞතික දියුණුව
   (ii) ජනතාවගේ ආධ්‍යාත්මික දියුණුව මැනවින් නිරූපණය කර ඇති අයුරු නියමිත කොටසින් **එක් කොටසකට උදාහරණ දෙක** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

   (i) අරමුණට උචිත අවස්ථා තෝරා ගැනීමත්
   (ii) ඊට උචිත පරිදි චරිත නිරූපණය කිරීමත් නිසා 'දියමන්ති මාලය' කෙටි කතාව රසවත් වී ඇති අයුරු **එක් කරුණකට උදාහරණ දෙක** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් පිළිතුරු සපයන්න.

05. උග්ගසේන සිටු පුත්‍රයාගේ චිත්ත ස්වභාවය අවස්ථානුකූල ව නිරූපණය කිරීමට කතුවරයා සමත් වී ඇති ආකාරය **උදාහරණ අවස්ථා තුනක්** ඇසුරින් පහදන්න. (ලකුණු 10 යි)

06. ජනතාවට අගනා උපදෙස් දීමට ජන කවියා සතු හැකියාව 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පද්‍ය පන්තියේ **සුදුසු උදාහරණ පද්‍ය තුනක්** ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

07. අතිශයෝක්තියක් නොහැඟෙන පරිදි වීණා නාදය ඇසීමට පැමිණි පිරිස අතිශයෝක්තියෙන් වර්ණනා කිරීමට ගුත්තිල කතුවරයා දැක්වූ දක්ෂතාව **උදාහරණ පද්‍ය තුනක්** ඇසුරෙන් විමසීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 11 ශ්‍රේණිය
ආදර්ශ පිළිතුරු පත්‍රය

### I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01. | 1 | 11. | 4 | 21. | 4 | 31. | 3 |
| 02. | 3 | 12. | 2 | 22. | 3 | 32. | 4 |
| 03. | 4 | 13. | 4 | 23. | 4 | 33. | 1 |
| 04. | 2 | 14. | 4 | 24. | 3 | 34. | 4 |
| 05. | 4 | 15. | 3 | 25. | 1 | 35. | 2 |
| 06. | 1 | 16. | 1 | 26. | 2 | 36. | 2 |
| 07. | 3 | 17. | 1 | 27. | 2 | 37. | 3 |
| 08. | 1 | 18. | 2 | 28. | 3 | 38. | 1 |
| 09. | 2 | 19. | 2 | 29. | 2 | 39. | 2 |
| 10. | 3 | 20. | 3 | 30. | 1 | 40. | 2 |

(1x40=40යි)

### II පත්‍රය

01. 1. අ. ඕෂ්ඨජ අක්ෂර
ආ. (අ)ං
2. අ. අභ්‍යවකාශයේ
ආ. පෘථිවිය
3. අ. රුවන් + ආර - ස්වර සන්ධිය
ආ. නළු + අඟන - පූර්ව ස්වර ලෝප සන්ධිය
4. අ. ධාවන ශූරයන් දැකීමට බොහෝ දෙනා මග දෙපස රැඳී සිටියහ.
ආ. මහ පැරකුම් රජතුමා විසින් කරවන ලද බෞද්ධාගමික ගොඩනැගිලි රැසක් පිළිබඳව වංශකතාවල සඳහන් විය.
5. අ. නායක හිමිපාණන් විසින් අනුශාසනාවක් කරනු ලැබිණි/ලැබුවේය.
ආ. නුඹලා විසින් අපි පිළිගනු ලැබුවෙමු.
6. අ. ලුහුබැඳීම
ආ. අන්වර්ථ
7. අ. සුබදායක
ආ. ප්‍රතිග්‍රහණ
8. අප සාම්ප්‍රදායික සාරධර්ම, සමාජ උරුමයන් හා ගුණ දහම් වැනසී යාමේ අභියෝගයට මුහුණ පා ඇත.
9. අ. ශ්‍රා + ඉෂ්ය
ආ. රඟ + උම්
10. අ. හොද්ද
ආ. විවාහ වීම (2x10=20 යි)

02. වාක්‍ය රචනය මුළු ලකුණු 25 යි.
ලකුණු විග්‍රහය
1. තේමාවට අදාළ බව, ව්‍යුහයට සමීප බව, සරු බව හා සමබව, වචන ගණන හා සුදුසු මාතෘකාව - 08 යි
2. උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය - 12 යි
3. වියරණ, අත් අකුරු, විරාම ලකුණු,ජේද වෙන් කිරීම, පද බෙදීම - 05 යි

03. සාරාංශකරණය ලකුණු 10 යි.
1. අන්තර්ගතය - 06
2. වචන ගණන - 02
3. ශිල්පීය දක්ෂතා - 02
(ලකුණු දීමේ දී සැලකිලිමත් විය යුත්තේ මුල වචන 65 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි.වචන ගණන අඩු වැඩි වන කල්හි අනුපාතිකව ලකුණු පිරිනමන්න.)

අන්තර්ගත විය යුතු කරුණු

1. වර්තමානයේ සමාජයීය, ආර්ථික පාරිසරික සෑම කටයුත්තක දී ම ගුවන් ගමනාගමනයට මුල් තැනක් දී ඇත.
2. කෘෂි නිෂ්පාදන කටයුතු හා ඒවා නව වෙළඳපලව හඳුන්වා දීම, වන ජීවීන් සංගණනය, ලැව් ගිනි මර්දනය, භූ සිතියම්කරණය, ගොඩබිම් හා සමුද්‍ර දූෂණය ඉන් කීපයකි.
3. අනතුරුවලට ලක් වූවන් ප්‍රවාහනය කිරීම, තෙල් නිෂ්පාදනය හා මහා පරිමාණ සවිකිරීම්,ලිපි බෙදා දීම හා මහජන ප්‍රවාහනය සඳහා හෙලිකොප්ටර් කුඩා ගුවන් යානා යොදා ගැනේ.
4. සංචාරක කර්මාන්තයේ දී ඊට වැදගත් තැනක් හිමි වේ.

04. අවබෝධය - ලකුණු 10 යි

1. මෝසම් පෙරමුණ තව දුරටත් උතුරට ගමන් කිරීම.
2. වායු ප්‍රවාහයේ දැඩි තෙතමනයක් පැවතීම හා කඳු නිසා ඒවා ඉහළට එසවීමේ දී ජලවාෂ්ප ඝනීභවනය වීම නිසා
3. ඝනීභවන ක්‍රියාවලියේ දී නිකුත් වන තාප ශක්තිය වායු ප්‍රවාහයට එකතු වීම.
4. අඩු - අගෝස්තු/ සැප්තැම්බර්
   වැඩි - ජූනි
5. නැත (ලකුණු 2x5=10 යි)

05. ප්‍රායෝගික ලේඛන - ලකුණු 15 යි.

1. ආකෘතිය - 05 යි
2. අන්තර්ගතය - 07 යි
3. ශිල්පීය දක්ෂතා - 03 යි

## III පත්‍රය

01. (i) (අ) මහෞෂධ පඬිතුමා
(ආ) වීරසිංහ ප්‍රතිරාජ ඇමතිවරයා

(ii) (අ) ප්‍රබුද්ධ
(ආ) අනාගත පරපුරට යහපත් රටක් උරුම කර දීම

(iii)(අ) වීණා වයන ලෙස හිඳ - පසෙක පනවන ලද
(ආ) උතුමා / කල්හී

(iv)(අ) රට ජාතිය වෙනුවෙන් යුද වැද මියයාම
(ආ) නිදහසේ දැහැන/ නිදහසේ මන්ත්‍රය

(v) (අ) බිරිඳ අතින් නැතිවූ දියමන්ති මාලය සෙවීම සඳහා
(ආ) මැටිල්ඩා/මැටිල්ඩා ලොයිසල්/ලොයිසල්ගේ බිරිඳ

(vi)(අ) පුරිස දම්ම සාරථී
(ආ) පාලි ධම්ම පදට්ඨ කතාව

(vii)(අ) උපදේශාත්මක/ දැනමුතුකමට කී කවි
(ආ) ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා

(viii)(අ) අංගුලිමාල
(ආ) බුදුන් වහන්සේගෙන් කමටහන් ගෙන වනයට ගොස් භාවනා කිරීමට සූදානම් වන අවස්ථාව

(ix)(අ) යහ ගී විරිත
(ආ) සමුද්‍ර ඝෝෂ විරිත

(x) (අ) සියබස්ලකර
(ආ) එළු සඳැස් ලකුණ (2x10=20යි)

02. 1. (අ) එක් සියයක් රජ දරුවන් මරා දමනු පිණිස සකස් කර තිබූ සුරාපානෝත්සවය විනාශ කිරීම නිසා කෝපයට පත් චූලනී රජ හා පිරිස මියුලු නුවර වැටලූ අවස්ථාව
(ආ) පොළවේ එක් අර්ධයක සිටගත් විට අනෙක් පස ඉස්සෙන තරම් සෙනග බිම්බරකි.ඒ තරම් දස ගුණයක පිරිස

2. (අ) සියලු සැප සම්පත් අත හැරීම
(ආ) සියලු සැප දෙන චින්තා මාණික්‍ය

3. (අ) උග්ගසේන සිටු පුත්‍රයා
(ආ) උග්ගසේන සිටු පුත්‍රයා සැට රියන් උස හුණු දණ්ඩෙන් වේගයෙන් බසිනු දුටු භික්ෂූන් වහන්සේලා පුදුමයට පත් වී ඔහුගෙන් කරුණු විමසා පසුව බුදුන් වහන්සේට ඒ තොරතුරු දන්වා සිටි අවස්ථාවේ ප්‍රකාශ කරන ලද්දකි.

4. (අ) සුළඟේ වේගයෙන් සසල වූ රළ පෙළ
(ආ) අනුප්‍රාසය

5. (අ) අම්මා
(ආ) අලුත් පන්තියේ සෞඛ්‍ය විද්‍යාව පාඩම උගන්වද්දී ලෙඩ බෝ කරන විෂ බීජ වැනි ක්ෂුද්‍ර ජීවීන් පිළිබඳව උගත් කරුණු අම්මා සමඟ පැවසූ අවස්ථාව (4x5=20යි)

03.
04. } ලකුණු 15 බැගින්

05.
06.
07. } ලකුණු 10 බැගින්